
# ඉන්ධන ආනයන වියදම

ඉන්ධන ආනයන වියදම ශ්‍රී ලංකාවේ ආනයන පැසෙහි විශාලතම අයිතමය වන අතර, එය පසුගිය වසර 10 තුළ සාමාන්‍යයෙන් වාර්ෂිකව මුළු ආනයනවලින් 20%ක් පමණ වේ. 2025 වසරේ දී බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව ඉහළ ගිය ද, 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.4ක් වූ ඉන්ධන ආනයන වියදම 2025 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4ක් දක්වා අඩු වූ අතර, එය ප්‍රධාන වශයෙන් බොරතෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ඒකක මිල අඩු වීම නිසා සිදු විය.

ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල විචලනයන්ට අනුකූලව, බොරතෙල් බැරලයක ආනයන මිලෙහි සාමාන්‍යය, 2024 වසරේ දී එ.ජ. ඩොලර් 84.7 සිට 2025 වසරේ දී එ.ජ. ඩොලර් 73.2ක් දක්වා පහත වැටුණි.


කෙසේ වෙතත්, මැදපෙරදිග යුද්ධයෙන් පසු ඉහළ ගිය භූ දේශපාලනික අර්බුද මධ්‍යයේ ගෝලීය තෙල් මිල ඉහළ සහ අස්ථාවර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය 2026 වසරේ දී ශ්‍රී ලංකාවේ ඉන්ධන ආනයන වියදම සැලකිය යුතු ලෙස වැඩි කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## වාර්ෂික ඉන්ධන ආනයන




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම

## බොරතෙල් ආනයන මිල ගණන්වල වාර්ෂික සාමාන්‍යය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම